**දෙවන වාර පරීක්ෂණය - 2020**

**ක්‍රිස්තියානි ධර්මය - 13 ශ්‍රේණිය.**

# I පත්‍රය

**පිළිතුරු**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | i | 11. | v | 21. | iv | 31. | i | 41. | i |
| 2. | iv | 12. | iii | 22. | v | 32. | iii | 42. | iv |
| 3. | ii | 13. | iv | 23. | iii | 33. | i | 43. | iii |
| 4. | iii | 14. | i | 24. | v | 34. | iii | 44. | iv |
| 5. | iv | 15. | v | 25. | iii | 35. | ii | 45. | i |
| 6. | i | 16. | iv | 26. | ii | 36. | iii | 46. | v |
| 7. | v | 17. | v | 27. | v | 37. | iii | 47. | iv |
| 8. | iii | 18. | i | 28. | v | 38. | iii | 48. | i |
| 9. | iv | 19. | iii | 29. | ii | 39. | v | 49. | ii |
| 10. | ii | 20. | ii | 30. | iv | 40. | v | 50. | iii |

(ලකුණු 1X2=100)

**ක්‍රිස්තියානි ධර්මය - 13 ශ්‍රේණිය.**

# II පත්‍රය

## I කොටස

01. i. සෙප්ටුවාජින්ත (ග්‍රීක) පිටපත, මැසොරෙටික් (හෙබ්‍රෙව්) පිටපත වුල්ගාතා (ලතින්) පිටපත ( 1:1 නිපුනතා මට්ටම)

ii. ජුදා හා ක්‍රිස්තියානි පිළිගැනීමට අනුව පුරාණ ගිවිසුමෙහි කෘති 39 යි.

කතෝලික පිළිගැනීමට අනුව පුරාණ ගිවිසුමෙහි පොත් 46 ම දේවානුභාවයෙන් ලියවී තිබීම. (1.1 නිපුනතා මට්ටම)

iii. ශුභාරංචි ග්‍රන්ථ - ක්‍රිස්තුන් වහන්සේ ජීවිතයේ තෝරා ගත් සිද්ධි කීපයක් ඇසුරින් ලියන ලද දේව ධාර්මික කෘතියකි.

අපොස්තුළුවරුන්ගේ ක්‍රියාපොත - ජේසුස් වහන්සේ ස්වර්ගාරෝහණය වන අවස්ථාවේ අපොස්තුළුවරුන්ට වදාළ පණිවිඩය යථාර්තයක් වූ ආකාරය ගෙහැර දැක්වීම.

හසුන් පත් - 13 ක කර්තෘත්වය ශුද්ධ වූ පාවුළුතුමාට 08 ක් වෙනත් හසුන් ලෙස දක්වයි.

ශුද්ධ වූ පාවුළුතුමාට කර්තෘත්වය හිමි වූවත් පාවුළුතුමාට විසින් නොලියූ හඳුන් පත් ද ඇත.

වෙනම නම් කර තිබේ නම් (1.1) නිපුණතා මට්ටම

iv. සිසුවා ලියා ඇති ආකාරය බලා ලකුණු ලබා දෙන්න. (ලකුණු 2 + 4 + 6 + 8 = 20)

02. i. කන්ද උඩ දේශනය, ධර්මදූත සේවය පිළිබඳ දේශනය, උපමා පිළිබඳ දේශනය, ශුද්ධ වූ සභාව හා එහි අධිකාරිත්වය පිළිබඳ දේශනය, යුගාන්තය පිළිබඳ දේශනය (5.1) නිපුණතා මට්ටම

ii. මතෙව් 7.28 - '' ජේසුස් වහන්සේ මේ වචන කියා නිම වූ කල්හි .....''

11. 1 - ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයින් දොළොස් දෙනාට උපදෙස් දී නිම කළ පසු ....''

13:53 - 'ජේසුස් වහන්සේ මේ උපමා කියා නිම කළ පසු ...''

19:1 'තවද ජේසුස් වහන්සේ මේ වචන වදාර නිමකොට.... ''

26:1 'තවද ජේසුස් වහන්සේ මේ සියල්ල වදාරා නිමකොට ...'' (5:1 නිපුණතා මට්ටම)

iii. අත්තික්කා ගස, කෙතෙහි වූ මනුෂ්‍යයන් දෙදෙනා, ස්ත්‍රීන් දෙදෙනා, විශ්වාසි හා අවිශ්වාසි දාසයෝ, යුවතියන් දසදෙනා, දාසයන් තිදෙනා, එළුවන්ගේන් බැටළුවන් වෙන් කිරීම. (ලකුණු 2 x 3=6) (13 ශ්‍රේණිය 8:2 නිපුනතා මට්ටම)

iv. මරණය, ලෙඩ රෝග, ස්වභාවික බලවේග, දුෂ්ට ආත්මයන් සිසුවා ලියා ඇති කරුණු සැලකිල්ලට ගෙන ලකුණු ලබා දෙන්න. (ලකුණු 2 + 4 + 6 + 8 = 20)

03. i. අධිරාජ්‍යයන් විසින් සියවස ආරම්භයේදීම කිතුනු සභාවට පීඩා ඇතිවීම.
කොන්ස්තන්තීනු අධිරාජ්‍යයා විසින් මිලාන් ආඥාව නිකුත් කිරීම හා සභාවට නිදහස ඇතිවීම්
සභාව තුළ ග්‍රීක සංස්කෘතිය වර්ධනය වීම.
ශු.සභාවට එරෙහිව පැණ නැගුණු දූර්මත හා වේද භේද නිරාකරණය කිරීමට සභාපියවරුන් නොපසුබවට ඉදිරිපත්වීම.
(8:1 නිපුනතා මට්ටම)

ii. අභ්‍යන්තර බලපෑම් හා නැගෙනහිරින් පැමිණි වයිකින්ග්න් ගෝත්‍රිකයන් බලපෑම මුස්ලිම් ආක්‍රමණ නිසා අධිරාජ්‍යගේ බලය හීන වීම.
මහා චාල්ස් රජතුමාගේ සාමගේ අධිරාජ්‍ය තුල පැවැති සාමය හා එකමුතුකම බිඳ වැටීම.
රෝමයේ පාප්තුමාලා හා කොන්ස්තන්තී නෝපලයේ ආදී පීතෘවරුන් අතර භේද පැවතීම.
දේශපාලන අත්ථාවරකම් හා පාප්තුමාලාගේ දූර්වලකම්
පාප්තුමාගේ බල තණ්හාව
පළමු නිකලත් පාප්තුමාගෙන් පසුව සභාව මෙහෙය වීමට ශුද්ධෝත්තම පියතුමකු නොමැතිවීම. ( 8:1 නිපුනතා මට්ටම)

iii. ශුද්ධ වූ සභාව රැකගැනීමේ පරමාර්ථයෙන් පාප්වරු අවි ආයුධ අතට ගනිමින් සටන් වැදීම.
කිතුනුවන්ගේ ඇදහිල්ල හා කිතුනු අනන්‍යතාවය රැකගැනීම සඳහා යුධ වැදීමේදී කුරුසයේ සංකේතය සලකුණු කිරීම.
ආධ්‍යාත්මික අරමුණක් කරා යුධ වැදුණද ලෞකික සැප සම්පත් රැස්කර ගැනීමට හා ශුද්ධ වූ සභාව පෝෂණය කිරීමට ක්‍රියා කළ බව.
ජෙරුසලම අත්පත්කර ගැනීමට ශුද්ධ වූ සභාවට හැකිවීම.
විශාල ජීවිත ගණනක් සභාවට අහිමි වීම. (8:1 නිපුනතා මට්ටම)

iv. ශුද්ධ වූ වින්සෙන්ති නිකායේ පුරෝගාමී වූ ශුද්ධ වූ වින්සෙන්හි පාවුලු තුමා
දිළිඳුන් කෙරෙහි ගැඹුරු ආදරය හා කරුණාව දැක්වීම.
ධර්ම දානය හා පූජක පුහුණුව හා ආදර්ශමත් පූජකවරු බිහිකිරීම.
මේවා ආදර්ශයට ගෙන සිසුවා ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 2 + 4 + 6 + 8 = 20)

## II කොටස

04. i. මෝසෙස්තුමා අග්‍රගණයේ දිවැසිවරයෙකි. පුරාණ ගිවිසුමේ දිවැසිවර
කැඳවීම පසුබිම් කර ගනිමින් මෝසෙස්තුමාද කැඳවීම ලබයි.
කැඳවීමේ ලක්ෂණ පහට අනුව මොසෙස්තුමාගේ කැඳවීම බයිබල් කතුවරයා ඉදිරිපත් කරන කරුණු තිබිය යුතුය.
දේව දර්ශනය - නික්ම යාම 3/1-6
දෙවිඳුන් දූකිත තේවාව ඉදිරිපත් කිරීම - නික්මයාම 3/7-10
කැඳවීම බාර ගැනීමට මොසෙස්තුමා මැලවීම - නික්මයාම 3/11, 3/13, 4/1, 4/10, 4/13
දෙවියන් වහන්සේ විසින් දිරිමත් කිරීම - 3/12, 3/14, 4/2-9,4/11 -
යවනු ලැබීම - නික්මයාම 4/17, 4/14
ඉහත කරුණු උපයෝගි කරගෙන පැහැදිලි කර තිබීම. (ල. 10)

ii. සිසුවා ලියා ඇති කරුණු ගැන බලා ලකුණු ලබාදෙන්න. (ලකුණු 2 x10=20)

05. i. හිල්කියාගේ පුත් ජෙරමියා බෙන්ජමින් වංශයට අයත්ය.
ජෙරමියා යන නාමයෙන් අර්ථය 'සමිඳාණන් වහන්සේ උසස් කළ සේක.'
දූත මෙහෙවර ජොෂියා, ජොහායාකිම්, ශෙදකියා යන රජුන්ගේ කාලයට සම්බන්ධයි.
දූත මෙහෙවර ක්‍රියාත්මක කලේ බැබිලෝනියානු විප්‍රවාසයට පෙරය.
ගිවිසුමේ නියමයන් පිළිපැදීම ඊශ්‍රායෙල් ජනතාවගේ වගකීම බව අවධාරණය කරයි.

ජනතාව සිත් හැරීමකට කැඳවන ජෙරමියා දිවැසිවරයා මුළු මහත් දේව ජනතාව සමඟ නව ගිවිසුමක් ඇති කරන බව ප්‍රකාශ කරයි.

ජෙරමියා ප්‍රකාශ කරන අලුත් ගිවිසුම සීනයි ගිවිසුමට වඩා වෙනස් බව පෙන්වයි.

ජීවමාන බව

යහපත් දිවියකට මග පෙන්වන මාර්ගෝපදේශයකි. ගිවිසුම ඉදිරියට ගෙන යෑම සඳහා සැබෑ සිත් හැරීමක් තිබිය යුතුය.

පුරාණ ගිවිසුමෙහි දිවැසිවරුන් ප්‍රකාශ කළ නව ගිවිසුම ක්‍රිස්තුන් වහන්සේ තුළ සම්පූර්ණයට පත්වූ බව පෙන්වා දෙයි.

ඉහත කරුණු උපයෝගී කරගෙන සිසුවා ලියා ඇති කරුණු වලට ලකුණු ලබා දෙන්න. (ල. 10)

ii. වෙනත් දෙවිවරුන්ට වන්දනා කිරීමේ පාපය ගණිකා වෘත්තියක්, වෛශ්‍යාකමක් ලෙස දක්වයි.

දෙවියන් වහන්ගේ ආදරය ගැන කථා කිරීමේදී සෑම වරදක්ම අමතකකර සමාව දෙන මිය ඇදුන අතීතය අමතක කර දමා අනාගතයට මුහුණ දෙන ස්වාමි පුරුෂයකු ලෙස දක්වයි.

දෙවියන් වහන්සේගේ යුක්තිය හා සාධාරණය වෙතටම ජනතාව කැඳවයි.

ජනතාව අන් දෙවිවරුන් වෙත යෑම තම භාර්යාව වෙනත් ස්වාමි පුරුෂයන් සොයා යෑමේදී ලැබූ වේදනාව පෙන්වා දෙයි.

දෙවියන් වහන්සේගේ මනාලිය ඊශ්‍රයෙල් ජනතාව ලෙසත් ඔවුන් දෙවිඳුන් හැර දමා ගියද ඔවුන්ට අනුකම්පා කරන බව පෙන්වා දෙයි.

තම දරුවනට සංකේතාත්මක නම් ලබා දීම.

ඉහත කරුණු අනුව පෙන්වා දී තිබේ නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 2x 10 = 20)

06. i. කිතුනු සංසවල වගකීම ගෙනහැර දැක්වීම, කෙටි අනුශාසනා යෙදීම, විශේෂ ප්‍රාර්ථනයන් නිරතුරුවම ඉදිරිපත් කිරීම, දේශනාවාදී ස්වරූපයෙන් ලියා තිබීම. පොදු කණ්ඩායමක් බොහෝ විට ඉලක්ක කිරීම.

සත්‍ය විශ්වාසයට හා අපෝස්තලික ඉගැන්වීම්වලට අනුකූලව විශ්වාසවන්ත ජීවිතයක් ගත කිරීම.

ධර්මය නිවැරදිව ඉගැන්වීම.

සභාව තුළ ඇති වගකීම හා නීතිරීති කිතුනු ප්‍රතිපත්ති අනුව ඉටු කිරීමටද මඟ පෙන්වීම.

කිතුනු සභා එකමුතුකම නිරතුරුවම වර්ධනය කළ යුතු බව

මිත්‍යා මත පිළිගැනීමෙන් ඉවත්ව ජීවත් විය යුතුබව

දෙවියන් වහන්සේගේ දයා කරුණාව අන් අයට ප්‍රකාශ කළ යුතුය.

සභා නායකයන් අන් අය ඉදිරියේ මනාව හැසිරිය යුතුය.

ඉහත කරුණු උපයෝගී කරගෙන පැහැදිලි කිරිම. (4:3 නිපුණතාවය)

ii. සිසුවා ලියා ඇති කරුණු ගැන සලකා බලා ලකුණු ලබා දෙන්න. (ලකුණු 10 x 2 = 20 යි)

07. i. පූජක, දිවැසිවර, රාජකීය යන ත්‍රිවිධ කාර්ය අනුව සිසුවා පාසල හා මියම තුළ ක්‍රියාවට නංවන අයුරු ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න.

(ලකුණු 10 6.1 නිපුණතා මට්ටම)

ii. සිසුවා ලියා ඇති කරුණු ගැන සලකා බලා ලකුණු ලබාදෙන්න. (ලකුණු 10 x 2 = 20 යි)

08. i. කොස්මස් ඉන්ඩිකෝප්ලෙයුන්ටන් නැමැති දේශ සංචාරකයන්ගේ සාක්ෂි

අනුරාධපුරයේ හමු වූ ගලක කෙටූ කුරුසිය

සිගිරි සමයේ සිටි මිගාරසෙන්පති

අපොස්තුළුවරයාගේ අනුගාමිකයන් මෙරට සිටි බවට පවතින සාක්ෂි

අබුසයිදේගේ සටහන්

බෙන්ජමින් රබායිගේ සටහන් ....... යන කරුණු විස්තර කර තිබේ නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 10) (9:1 නිපුණතාවය)

ii. ධර්මදූතවරුන්ගේ ඇඩි කැපවීම හා උද්යෝගය

ධර්මය ප්‍රචාරය කිරීමේදී අනුගමනය කළ ධර්ම ප්‍රචාර ක්‍රම.

ධර්ම දූතයින්ගේ සරල, චාම්, ජීවිත රටා හා ආදර්ශ දිවි පැවැත්ම

කුලභේද නොතිබීම.

කිතුනු ධර්මය ධීවර ජනතාවට ඉතා සමීප වීම.

ඉහත කරුණු උපයෝගී කරගෙන සිසුවා ලියා ඇති කරුණු ගැන බලා ලකුණු ලබාදෙන්න. (9:2 නිපුණතාමට්ටම)

(ලකුණු 10 x 2 = 20 යි)